# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89 — 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාදා — 1973.12.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1719 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1730 |

සැලකිය යුතුයි.—පොලිස් (සංශෝධන) පනතේ කෙටුම්පත 1973 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## තනතුරු—ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරවනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිතව සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිතු වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. පමාවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

**3 : 1** රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

**3 : 2** අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

**3 : 3** දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, (අවශ්‍ය නම්) අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී නව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ සඟක දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු, රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාව තීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම කැමැත්තෙන් එම සේවාවන්ගෙන් අස් වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද, ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව කැපකිරීම් නම්ද, වයස අඩුකත් සුදුසුකම් ලබා

ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදාහැරිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතුවනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ගෘහ නිර්මාණ ශිල්පී තනතුර—නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව

නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පී තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරගනු ලබන ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, නිදහස් චතුරශ්‍රය, කොළඹ 7, යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතු ය.

(අ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1974. 01. 07

(ආ) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1974. 01. 15

**සටහන්.—**

(i) ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) අයදුම්පත් ලියා පදිංචි තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතු ය.

(iii) පිටරට අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්න ම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—**ශ්‍රී ලංකා ජනරජය යටතේ, සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, එසේම ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වැය වන යානපත්‍ර වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—** (අ) මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. පත්වීම අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. නමුත්, 1971. 12. 31 දින දක්වා රජයේ ස්ථිර සේවයෙහි සිටි, දැනටමත් රජයේ ස්ථිර සේවයෙහි නියුක්තව සිටින, විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පත්වීම් ලැබූ නිලධාරීන් එම අයිතිවාසිකම් තබාගුරමක්, තුන්ති විඳිනු ඇත.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කරනු ඇත. රාජ්‍ය සේවයෙහි නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වන ඇත. තනතුරෙහි ස්ථිර කිරීමේ දී ශ්‍රේණියට උසස් වීම ලැබූ දින පටන් ඔවුන් නියමිත වැටුප් ක්‍රමයෙහි ආයතන සංග්‍රහයේ කොන්දේසි අනුව පිහිටුවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.—**මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප මෙසේ ය :

වර්ෂයකට රු. 7,800—9 × 360—සහ රු. 11 × 480—රු. 16,320.

වර්ෂයකට රු. 9,600 සහ රු. 13,920 වැටුප් පියවර වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

රු. 13,440 ඉක්මවා වැටුප් ලැබීමට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගත යුතු ය.

සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලත් අයදුම්කරුවන් රු. 9,960 ආරම්භක වැටුප මත තබනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.—**සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) (i) බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය තිබෙන බව හෝ,

(ii) ඕස්ට්‍රේලියානු ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය තිබෙන බව හෝ,

(iii) බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ ඕස්ට්‍රේලියානු ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ හෝ අවසාන පරීක්ෂණයේ කොටස් I හා II සමත් වී ඇති බව.

(ඇ) 1974. 01. 07 වැනි දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් මෙම වයස් සීමාවන් බලපානු නොලැබේ.

5. පහත සඳහන් ලිය කියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි සම්බන්ධ උපකාර පාසැලක නියෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතික ;

(ඇ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඈ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතු ය ;

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

**සටහන්.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලිය කියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම් පත් හෝ ඒ පිළිබඳ අනෙක් ලිය කියවිලි සියල්ලක්ම රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කට යුතු අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් මෙම කාර්යාලයට ලැබුණු බව ඉල්ලුම් කරුවනට දන්වනු ලැබේ. අයදුම් පත භාර ගන්නා දිනයේ සිට සති දෙකක් ඇතුළත, තම අයදුම් පත ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ අයදුම් කරුවන් විසින් ඒ බව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට වහාම දැනුම් දිය යුතු ය. මේ විධිවිධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම් කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

1973 නොවැම්බර් 27 වැනිද,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය)

**නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පී තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය—
වර්ෂය :———— මාසය :———— දිනය :————

(ආ) දේශීය ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස—
වර්ෂය :———— මාසය :———— දිනය :————

4. ඔබ ලංකා රට වැසියෙක් ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශවයේ සීයාගේ :————.

(ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තිය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10 ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද ? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද ? :————.

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් :————.
(ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සාමාර්ථ, වෘත්තීය සුදුසුකම්වල විස්තර, ඒවායේ දින හෝ පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් ————.

(රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දිනයන්ද ඇතුලුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇත්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේනම් ඒවා :————.

16. මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දිනය :————. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

### රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ අමාත්‍යාංශය

### නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ

### ආධුනික නගර නිර්මාණ සහකාර තනතුර

නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ ආධුනික නගර නිර්මාණ සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් දන්වනු ලැබේ. මෙම ගැසට්පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයට හෝ ඊට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, නිදහස් චතුරශ්‍රය, කොළඹ 7 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1974. 01. 07

(ආ) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1974. 01. 15

සටහන.— (i) ආදර්ශ ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) අයදුම්පත් ලියා පදිංචි තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම් කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, එසේම ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වැයවන යාන පත්‍ර වියදමත්, එම නිලධාරීන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(අ) මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. පත්වීම අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. නමුත් 1971. 12. 31 දින දක්වා රජයේ ස්ථිර සේවයෙහි සිටි, දැනටමත් රජයේ ස්ථිර සේවයෙහි නියුක්තව සිටින විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පත්වීම් ලැබූ නිලධාරීන් එම අයිතිවාසිකම් තව දුරටත් භුක්ති විඳිනු ඇත.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත්කරනු ඇත. රාජ්‍ය සේවයෙහි නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු කාලපරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත. තනතුරෙහි ස්ථිර කිරීමේ දී ශ්‍රේණියට උසස්වීම ලැබූ දින පටන් ඔවුන් නියමිත වැටුප් ක්‍රමයෙහි ආයතන සංග්‍රහයේ කොන්දේසි අනුව පිහිටවනු ලැබේ.

තෝරාගත් අයදුම්කරු නගර නිර්මාණය සම්බන්ධයෙන් පුහුණුවක් ලැබීම සඳහා විදේශයකට යාමට ඉඩ ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 6,720 න් පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 6 කින්, රු. 8,80 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1974 ජනවාරි මස 07 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 35 කට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙම වයස් සීමාව බල පවත්වන්නේ නැත.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ලබා තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(ඇ) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතකට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර, මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් මෙම කාර්යාලයට ලැබුනු බව ඉල්ලුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම් පත භාරගන්නා දිනයේ සිට සති දෙකක් ඇතුළත, තම අයදුම් පත ලැබුනු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ අයදුම්කරුවන් විසින් ඒ බව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට වහාම දැනුම් දිය යුතුය. මේ විධිවිධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම් කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

සී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1973 නොවැම්බර් 27 වැනිදා,
කොළඹ 7,
නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය)

නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ
ආධුනික නගර නිර්මාණ සහකාර තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :———, මාසය :———, දිනය :———.

(ආ) දේශීය ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :————.

වර්ෂය :———, මාසය :———, දිනය :———.

4. ඔබ ලංකා රටවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නො වේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද? .————

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක්ද එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

(ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමර්ථ, වෘත්තීය සුදුසුකම්වල විස්තර, ඒවායේ දින හෝ පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න) :————.

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :————.

(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැළකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.

(දැන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේනම් ඒවා :————.

16. මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙනවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

12–161—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : එස්. එච්. 898/72.

පොලිස් දෙපාර්තමේන්තුව

**පොලිස් අභ්‍යාස විද්‍යාලයේ හේවිසි කණ්ඩායමෙහි 'තූර්යවාදක නායක ලෙස' පාරිවාසික පොලිස් උප පරීක්ෂකවරයෙකු බඳවා ගැනීම**

පොලිස් අභ්‍යාස විද්‍යාලයෙහි හේවිසි කණ්ඩායමෙහි 'තූර්යවාදක නායක' ලෙස පාරිවාසික උප පොලිස් පරීක්ෂකවරයෙකුගේ තනතුර සඳහා ශ්‍රී ලංකාවෙහි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. යාකරන ලද ආදර්ශ ආකෘති පත්‍රයෙහි සකස් විය යුතු අයදුම්පත්, කොළඹ 1, නවපේවියෙහි, කොමසාරියට් වීදියෙහි, බඳවා ගැනීමේ කාර්යාලයෙහි, පොලිස් අධිකාරී වෙත, 1973.12.31 දිනා හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙම දෙපාර්තමේන්තුවෙන් අයදුම්පත් නිකුත් නොකෙරෙන අතර, අයදුම්පත් සඳහා කරනු ලබන ඉල්ලීම්ද පිළි නොගනු ඇත. අයදුම් පත්‍රය බහා එවන කවරයෙහි වම් කෙළවරෙහි ඉහලින්, 'පොලිස් හේවිසි කණ්ඩායමෙහි පාරිවාසික උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත' යනුවෙන් සඳහන් කළ යුතුය.

3. (අ) රාජ්‍ය සේවයෙහි යෙදී සිටින, සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

(ආ) අයදුම්කරුවන් අවශ්‍ය විස්තර ස්වකීය අත්අකුරු වලින්ම සම්පූර්ණ කර සහතික පිටපත් සමග 2 වන ඡේදයෙහි සඳහන් කර ඇති ලිපිනයට තැපැල් කළ යුතු අතරම, කිසිම හේතුවක් නිසාවත් පොලිස්පතිට හෝ වෙනත් නිලධාරියකුට පෞද්ගලිකව නොඑවිය යුතුය.

4. වැටුප් පරිමාණය.—රු. $\frac{4,260—7,320}{17 \times 180}$

5. අවශ්‍ය සුදුසුකම්.—(අ) වයස් සීමාව : වයස අවුරුදු 19 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය.

සටහන : 1958.03.20 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක : 434 න් දක්වා ඇති වයස පිළිබඳව පිරිනමනු ලබන අනුග්‍රහය සන්නද්ධ සේවාවන්හි සේවා මුක්ත භටයන් සම්බන්ධයෙන් බලපානු ඇත.

(ආ) අධ්‍යාපනික සුදුසුකම්.—අපේක්ෂකයන්, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට උසස් විභාග වලින් හෝ, සිංහල භාෂාව, දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළත් විෂයයන් සයකට අඩු නොවන සේ දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සමත්ව ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ සමත්වී සිටිය යුතුය.

(ඇ) සංගීතමය සුදුසුකම්.—(i) යටත් පිරිසෙයින් රජයේ ලලිත කලායතනයෙහි පෙරදිග සංගීතය පිළිබඳ සිවුවන වසරේයි සහතිකය, ගායනය සහ තූර්ය භාණ්ඩ වාදනය යන අංශදෙකින් යුක්තව ලබා සිටිය යුතුය.

(ii) යටත් පිරිසෙයින්, 'ගාන්ධර්ව සංගීත' පරීක්ෂණයේ පළමුවන පියවරෙන් යෝග්‍යතාවය ලැබ සිටිය යුතුය.

(iii) උඩරට බෙර වාදනයේ න්‍යාය හා ප්‍රායෝගිකත්වය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

(iv) ජනගායනය සහ ගැමි සිංදු පිළිබඳ දැනීමක් ලැබ සිටිය යුතු අතර, පෙරදිග වාද්‍ය භාණ්ඩවලට අනුකූල වන පරිදි ගායනා රචනයට සහ සැකැසුමට විශේෂ දක්ෂතාවයක් තිබිය යුතුය.

(v) හේවිසි කණ්ඩායමක් මෙහෙයවීම පිළිබඳව යටත් පිරිසෙයින් තුන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) ශාරීරික සුදුසුකම් :—

උස : අඩි 5 යි අඟල් 6 යි.

පපුව : අඟල් 34 යි (හුස්ම නොගෙන).

ඇස් පෙනුම : වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. උපැස් පාවිච්චිය අවශ්‍ය වන කවර අපේක්ෂකයෙකු හෝ බඳවා ගැනීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

කෙසේ වුවද, අධ්‍යාපනික හා ශාරීරික සුදුසුකම් පිළිබඳ මද ඌණතා වන් නොතකා, තූර්ය වාදක කණ්ඩායම් සඳහා විශේෂ සංගීතමය කුසලතා ඇති අයදුම්කරුවකු මෙම තනතුරට පත් කිරීමෙහිලා ස්වකීය අභිමතය පාවිච්චි කිරීමට පොලිස්පතිට ඉඩ ඇත.

(ඉ) අනෙකුත් සුදුසුකම්.—(i) අයදුම්කරුවන් ලාංකිකයන් විය යුත්තාහ.

(ii) ඔව්හු අවිවාහකයන් විය යුත්තාහ.

6. **බඳවා ගැනීමේ ක්‍රමය.**—දන්වීම් පළකිරීම මගින් මේ සඳහා සංස්ථාපනය කෙරෙන තේරීම් මණ්ඩල විසින් පවත්වනු ලබන ප්‍රාථමික සහ අවසාන සම්මුඛ පරීක්ෂණ මගින්.

7. **සේවයෙහි ස්ථිර කරවීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. පත් කරනු ලැබුවන් තුන් අවුරුදු පරීක්ෂා කාලයකට යටත් විය යුතු අතර, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුත්තාහ.

8. **සේවා කොන්දේසි.**—(i) ආයතනයෙහි 11 වැනි පරිච්ඡේදයේ 10 : 6 සහ 10 : 14 උප වගන්ති අදාල වනු ඇත.

(ii) පත්වීම තුන් අවුරුදු පරීක්ෂා කාලයකට යටත්වනු ඇත.

(iii) ඔව්හු දෙපාර්තමේන්තු නියෝගවලටද, පොලිස් විනය නීති සංග්‍රහයටද, පොලිස්පති විසින් හෝ රජය විසින් හෝ මිටින් මිට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝග ඇතොත් ඒවාටද යටත් විය යුත්තාහ.

(iv) සේවයෙහි ස්ථිර කරනු ලැබීමට පෙර ඔවුන්, නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණ වලින් සමත් වීමට අපොහොසත් වන අය නොහොත්, පොලිස් රාජකාරී කටයුතු හෝ හේවිසි කණ්ඩායමේ රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යයි තීරණය වන අය සේවයෙන් ඉවත් කරනු ලැබීමට යටත් වනු ඇත.

(v) ඔවුන් ස්වකීය පත්වීම්වල ස්ථිර කෙරෙන තුරු ඔවුනට විවාහවීම සඳහා ඉඩදෙනු නොලැබේ. අවුරුදු දෙකක සතුටුදායක සේවයක් සම්පූර්ණ කළ අයගෙන් විවාහවීම සඳහා ලැබෙන අයදුම් පත්, පොලිස්පතිගේ අභිමතය පරිදි සැලකිල්ලට භාජනය වනු ඇත.

(vi) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් පොලිස් අභ්‍යාස විද්‍යාල යෙහි හේවිසි කණ්ඩායමෙහි පූර්ණ කාලීන රාජකාරී කටයුතුවල සේවයෙහි යොදවනු ලබන නමුත්, අවශ්‍ය අවස්ථා එළඹී නම් එවිට පොලිස් රාජකාරී කටයුතුවලද යෙදවීමට ඉඩ ඇත.

9. මෙම ගැසට් පත්‍රයෙහි I වැනි කොටස (IIඅ) වැනි ඡේදය ආරම්භයෙහි දැක්වෙන, රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් වලට මෙම ලියවිලිවල පිට පත් ඇමිණිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.
(ii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්, සහ
(iii) අධ්‍යාපනික සුදුසුකම් සහ සංගීතමය සුදුසුකම් සම්බන්ධයෙන් ලබාගත් සහතික.

11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී එවන සහ ගැසට් නිවේදනයට අනුකූල නොවන, අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

ඩී. එස්. ඊ. පී. ආර්. සේනානායක,
පොලිස්පති.

1973 නොවැම්බර් මස 22 වන දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේදීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

පරිවාසික උප පොලිස් පරීක්ෂක (තූර්ය වාදක කණ්ඩායම)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අයදුම්කරුගේ උප්පැන්න සහතිකයෙහි සඳහන් වී ඇති පරිද්දෙන්ම විය යුතුය)

2. පියාගේ සම්පූර්ණ නම :————.

3. පියාගේ රක්ෂාව :————.

4. අයදුම්කරු උපන් ස්ථානය :————.
උපන් ස්ථානය අයත් වන කිට්ටුම පොලිස් ස්ථානය :————.
පළාත :————.

5. උස :————, පපුව (හුස්ම නොගෙන) :————.

6. 73. 12. 31 දිනට වයස :————.
උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

7. (අ) ජාතිය :————.
(ආ) ඔබ ශ්‍රී ලංකාවෙහි පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද ? :————.
(ලියා පදිංචිවීමෙන් නම් ලියා පදිංචි කිරීම පිළිබඳ සහතික යෙහි පිටපතක් ඇමිණිය යුතුයි)
(ඇ) ඔබ පරම්පරාවෙන් ශ්‍රී ලංකාවෙහි පුරවැසියකු වී නම්, උපන් ස්ථානය සඳහන් කරන්න :
(i) අයදුම්කරු .————.
(ii) අයදුම්කරුගේ පියා :————.
(iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(iv) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

8. (අ) දැනට ලිපිනය :————.
(ආ) එම ලිපිනයට කිට්ටුම පොලිස් ස්ථානය :————.

9. (අ) විවාහක, අවිවාහක බව :————.
(ආ) ඔබට අනියම් භාර්යාවක් සිටී ද :————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති උසස්ම විභාගය සඳහන් කර, සහතිකවල පිටපත් ද අමුණන්න) :————.

11. සංගීතය පිළිබඳ සුදුසුකම් (සහතික පිටපත් අමුණන්න) :————.

12. ඔබට විශේෂ අභිරුචිකම් තිබේ ද ? :————.

13. ඔබ පිළිබඳව හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න :————.

14. ඔබ සන්නද්ධ සේවාවන්හි සේවය කර ඇත්ද? නැතහොත් ඔබ සන්නද්ධ සේවාවන්ට අනුයුක්ත කරනු ලැබ සිටීද? නැතහොත් ඔබ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යුද්ධ ඛඳවුරුවල සේවකයකු වී සිටියෙහිද? (අස්වීමේ දී දෙන ලද සහතික වල පිටපත් අමුණන්න) :————.

15. ඔබ යම් කාලසීමාවක රජය යටතේ සේවය කර තිබේද? එසේ නම් කාලසීමාව, දෙපාර්තමේන්තුව, සහ ඔබ දැරූ තනතුර ද ඔබ එම දෙපාර්තමේන්තුව හැරයාමට හේතු වූ කරුණු ද විස්තරාත්මකව සඳහන් කරන්න :————.

16. (අ) ඔබ යම් දිනක පොලිස් සේවාවෙහි යම්කිසි තනතුරක් සඳහා ඉල්ලුම්කර තිබේද? (එසේ නම් එකී ලියකියවිලි පිළිබඳ තොරතුරු දක්වන්න) :————.
(ආ) ඔබ මීට පෙර පොලිස් සේවාවෙහි යෙදී සිටියෙහිද? :————.

17. දැනට යෙදී සිටින රැකියාව :————.

18. ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද? එසේ නම් විස්තර සපයන්න :————.

ඉහත සඳහන් කරුණු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් මම ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-110—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

අංකය : වීඅං/4/162.

අධ්‍යාපන අමාත්‍යාංශය

1974 මැලේසියානු පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1974 මැයි සිට පහත සඳහන් ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා මැලේසියානු රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:—

කලා විෂයයන්
විද්‍යා විෂයයන්
වෛද්‍ය විද්‍යාව
කෘෂිකර්මය
ඉංජිනේරු විද්‍යාව
ආර්ථික විද්‍යාව හා පරිපාලනය
අධ්‍යාපන විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මිනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය.

මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, එවේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් අදාල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන් නම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 27 වැනි ද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

12-133—73. 12. 07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### අම්පිටිය අංග විකල වූවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකාර තනතුර

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අම්පිටිය, අංග විකල වූවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කර ගතයුතු ඉල්ලුම් පත්‍ර 1973. 12. 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, වොක්ෂෝල් වීදියේ, සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප.**—මෙම තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් පරිමාණය වර්ෂයකට රු. 6,024—4×144—8×180—රු. 8,040 වේ. (රුපියල් 6,780 හා රු. 7,500 වාර්ෂික වැටුප් ලැබීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථසාධක අර මුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම—**

(අ) 1973. 12. 31 වැනි දිනට වයසින් අවුරුදු 25 ට නොඅඩු බවටත්, අවුරුදු 45 ට නොවැඩි බවටත්,

(**සංලක්ෂය :** දෙපාර්තමේන්තුවේ සේවකයින්ට මෙම වයස් බලපාන්නේ නැත.)

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය/අංක ගණිතය ඇතුළුව විෂයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී ලබ ගන්නා ලද අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) සහ එයට අමතරව පහත සඳහන් සහතික පත්වලින් එකක් ලබා තිබීම—

(i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය (යාන්ත්‍රික හා විදුලි කාර්මික)

හෝ

(ii) අම්පාරේ හාඩි කාර්මික ආයතනයේ ඩිප්ලෝමා සහතිකය

හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු සහතිකය

හෝ

(iv) සමාන සුදුසුකම් සහ

(ඇ) පිළිගත් ආයතනයක කාර්මික වැඩ සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් පස් අවුරුද්දක පළපුරුද්දක්.

**සටහන :** ගොඩනැගිලි තැනීම සම්බන්ධව ප්‍රායෝගික අත්දැකීමක් ඇති අයට වැඩි සැලකිල්ල දක්වනවා ඇත.

(ඈ) යහපත් කල් ක්‍රියාවෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත්, සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත දිනට පෙර ලැබී ඇත්නම් හා ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඒවා පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස නැත්නම් පිළිගනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

(ආ) 4 වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපනික, කාර්මික හා අනෙක් සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික පත්‍ර.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ සහතික පත්‍ර දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම උප ඡේදයන් නියමිත සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

7. අයදුම් පත් හෝ ඊට අදාල වෙනත් ලිපි ආදිය හෝ එවිය යුත්තේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුට පුද්ගලිකව නොවේ.

8. ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වන කාණ්ඩයේ ආරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

සෙ. වී. ගුණවර්ධන,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1973. 11. 27 වැනි දින,
කොළඹ 2, තැ. පෙ. 577,
අංක 136, වොක්ෂෝල් වීදිය,
ඇබර්ඩීන් ගොඩනැගිල්ල,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

අම්පිටිය අංග විකල වූවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකාර තනතුර

1. සම්පූර්ණ නම : (පැහැදිලි අකුරින් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.

2. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3. (අ) 1973. 12. 31 වැනි දිනට නියම වයස : අවුරුදු————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය.)

4. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයකු වන්නේ :—
   (i) පරම්පරාවෙන් ද :————.
   (ii) ලියාපදිංචි වීමෙන් ද :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :—
   (අ) (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.
   (ආ) කාර්මික සුදුසුකම් :————.
   (ඇ) විශේෂ සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

7. මේ භාෂාවෙන් හොඳ හැටි කථා කිරීමට හා ලිවීමට ඔබට හැකිදැයි දන්වන්න :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.

8. පාසැලෙන් අස් වූ පසු යෙදී සිටි රැකී රක්ෂා පිළිබඳ විස්තර දක්වන්න :————.

9. ඔබේ හැකියාවන් සහ චරිතය පිළිබඳව අසා දැන ගත හැකි ප්‍රසිද්ධ භවතුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දන්වන්න :————.

10. අමුණන ලද චරිත සහතික පත් දුන් භවතුන් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-127—73. 12. 07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වැඩ පරීක්ෂක තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1973 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙනසේ, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත එවිය යුතුය.

**2. වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය රු. 4,152—16×144—රු. 6,456 කි. රු. 5,304 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

නිලධාරියා විසින් සිය ඒකාබද්ධ වැටුපින් සියයට හයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, ඊට රජයේ දායක මුදල් වශයෙන් ඒකාබද්ධ වැටුපෙන් සියයට නවයක් ගෙවනු ඇත.

1971. 12. 31 වැනි දින වන විට ස්ථිරවූත්, විශ්‍රාම වැටුප් සහිතවූත් තත්ත්වයේ සිටි රජයේ සේවකයකු තෝරාගනු ලැබුවහොත්, ඔහු විශ්‍රාම වැටුප් සහිත පදනමක් මත පත් කෙරෙනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙක්ම, තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973 දෙසැම්බර් 31 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) ගණිතය හා භෞතික විද්‍යාවට සම්මාන සාමාර්ථ සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය (සම්මාන) භෞතික විද්‍යාව (සම්මාන) සහ තවත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වීම ; සහ

(ඈ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ ගල් ඔය සංවර්ධන මණ්ඩලයේ හෝ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය, හෝ මැනීම සහ මට්ටම් පිළිබඳ මිනුම්පතියේ බලපත්‍රය, ජලසම්පාදන සහ ගොඩනැගිලි කටයුතු වැනි නිර්මාණාත්මක වැඩ පිළිබඳව අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ද තිබිය යුතුය ; හෝ

(ii) පස් අවුරුදු සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආධුනිකත්වය හෝ මුළු එකතුව පස් අවුරුද්දකට නොඅඩු ආධුනිකත්වයක් හා ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම ;

මෙයින් කුමන සුදුසුකමක් සමග වුවද මැනීම් හා මට්ටම් කිරීම් පිළිබඳවද ගොඩනැගිලි තැනීම හෝ අති විශාල නිර්මාණ කටයුතු පිළිබඳවද න්‍යායානුකූල දැනීමක් සහ ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය.

5. සෑම ඉල්ලුම්කරුවෙක්ම තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි අනුව උප්පැන්න පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු ලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික,

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතික තුනක්,

(ඈ) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

සැ. යු.—මෙම සහතික පත්වල මුල් පිටපත් අමුණා නොඑවිය යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඊට අදාල සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙතය. මගේ හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට ඉල්ලුම් පත්‍ර හෝ ලියකියවිලි නොඑවිය යුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

එල්. ඕ. මාරඹේ,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන).

1973 නොවැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

### ඉල්ලුම් පත්‍ර ආකෘතිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. 1973 දෙසැම්බර් 31 වැනි දිනට වයස හා උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. ජාතිය :————.
5. විවාහකද අවිවාහකද යන වග :————.
6. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග :————.
   (1) උත්පත්තියෙන්ද :————.
   (2) නැතහොත් ලියා පදිංචි වීමෙන්ද :————.
7. අධ්‍යාපන හා ශිල්පීය සුදුසුකම් :————. (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.)
8. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා හෝ හැදෑරූ පාඨමාලා පිළිබඳ විස්තර :————.
9. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතු :————.
10. යම්කිසි සාපරාධී වරදකට කෙදීහක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර :————.
11. චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම
    1. ————.
    2. ————.
    3. ————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12-88—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

### VI ශ්‍රේණියේ ලඝුලේඛක තනතුරු (සිංහල)

බැංකු සේවයේ සිංහල ලඝුලේඛක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම අයදුම්පත් කොළඹ, 2, සර් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවතේ, ර. ලි. සේ. සංගම් ගොඩනැගිල්ලෙහි පිහිටි මහජන බැංකුවේ, සේවක කළමනාකරුගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර යන්හි විය යුතු අතර, 1974 ජනවාරි මස 10 වන දින හෝ ඊට පෙර ඔහු වෙත ලැබිය යුතුය.

පැමිණ ඉල්ලුම් කරන්නන් වෙත අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනුයේ තැපැල් මගින් පමණක් වන අතර, ඒ සඳහා තම ලිපිනය ලියූ, මුද්දර ගැසූ දිග ලිපි කවරයක් ද, 2 (ඇ) ඡේදය යටතේ අවශ්‍ය පරිදි ලඝු ලේඛනය සහ විශේෂකර යතුරු පුවරුවෙහි යතුරු ලියනය සඳහා වේගයන් ඇති බව සනාථ කරනු පිණිස ලබාගත් සහතික සත්‍ය පිටපතක් ද එවිය යුතුය. 1973 දෙසැම්බර් මස 31 වන දිනට පසු අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

(i) **වැටුප් හා දීමනා.**—(i) වැටුප් පරිමාව රු. 118 — රු. 310
16×6, 4×7, 1×8, 6×10

(ii) බැංකු පරිමාවන් අනුව ජීවනක දීමනා හා අනිකුත් දීමනා.

(2) **සුදුසුකම් :**

(අ) **වයස.**—අයදුම්කරුවන් 1974 ජනවාරි මස 10 දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ආ) ජාතිය.—අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් :

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය (සිංහල භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය හෝ වානිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (6) එක්වර සමත් වීම.) ; හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ (ලඝුලේඛක යතුරු ලියන්නන් සඳහා) උසස් වානිජ සහතිකය.

(ඈ) වේගය.—පහත දැක්වෙන වේගයන් අනුව ලඝු හනින් සටහන් ගැනීමටද, පිළිවෙලට හා නිවැරදිව විජේසේකර යතුරු පුවරු වෙහි යතුරු ලිවීමටද, අයදුම්කරුවන්ට හැකි විය යුතුය.

| | | |
|---|---|---|
| ලඝුලේඛනය—විනාඩියකට වචන ... | ... | 80 |
| යතුරු ලියනය—විනාඩියකට වචන ... | ... | 25 |

ඉංග්‍රීසි ලඝුලේඛනය හා යතුරු ලියනය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(3) අයදුම්කරුවන් තම අයදුම් පතට පහත සඳහන් සහතික වල සත්‍ය පිටපත් ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ යෝග්‍යතාවය සම්බන්ධයෙන් මෑතකදී ලබා ගත් සහතික තුනක්.

(4) සේවා කොන්දේසි.—තෝරාගත් අයදුම්කරුවන් :—

(අ) පත්වීම් ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමටද,

(ආ) අවුරුද්දකට නොඅඩු අවුරුදු තුනකට නොවැඩි පරිවාස කාලයක් යටතේ සේවය කිරීමට ද,

(ඇ) බැංකු සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයෙකු වීමට ද,

(ඈ) ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට ද එකඟ විය යුතු වේ.

(5) ඇප.—තෝරා ගැනුනු අයදුම්කරුවන් විසින් රු. 500 ක ඇප මුදලක් තැන්පත් කිරීම අවශ්‍ය වේ.

(6) පොදු.—කොළඹ දී පැවැත්වෙන ලඝුලේඛණය සහ යතුරු ලියනය පිළිබඳ පරීක්ෂණයකටද, සම්මුඛ පරීක්ෂණයකට ද අයදුම් කරුවන් පෙනී සිටීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

(7) තම අයදුම් පත් ලේඛන ගත තැපැලෙන් එවන මෙන් අයදුම් කරුවන්ට උපදෙස් දෙමු. තම අයදුම් පත් ලද බව දැනුම් දෙනු ලැබීමට කැමති අයදුම්කරුවන්, අයදුම් පත් සමග තම ලිපිනය ලියූ මුද්දර ගැසූ ලිපි කවරයක් එවිය යුතුය.

අයදුම්පත් එවන ලිපි කවරයේ වම් උඩු කෙළවරේ "සිංහල ලඝු ලේඛක තනතුරු සඳහා අයදුම් පත" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

අවශ්‍ය සුදුසුකම් නොමැති නම් අයදුම් නොකරන මෙන් කරුණා වෙන් ඉල්ලමු.

සේවක කළමනාකරු.

මහජන බැංකුව,
ර. ලි. සේ. සංගම් ගොඩනැගිල්ල,
චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1973 නොවැම්බර් මස 23 දින.

12-125—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

පහත සඳහන් පුරප්පාඩු සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පොත් තබන්නා තනතුර.—වැටුප් පරිමාණය.—රු. 450—5×20—රු. 550.

සුදුසුකම්.—(1) ලංඩනයේ පොත් තබන්නන්ගේ ආයතනයෙහි අවසාන පරීක්ෂණය ; හෝ

(2) කැණිෂ්ඨ විශ්ව විද්‍යාලයෙක පොත් තැබීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හෝ සහිතව

පොත් තැබීම පිළිබඳව දස අවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

2. මණ්ඩලික හෙදි තනතුර.—වැටුප් පරිමාණය.—රු. 500—5×20—රු. 600.

සුදුසුකම්.—සාමාන්‍ය සාත්තු සේවය පිළිබඳ ඩිප්ලෝමාව සහිතව, සුදුසුකම් ලැබීමෙන් පසු තුන් අවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

3. (යාන්ත්‍රික සැලසුම්කරු තනතුර.—(තාවකාලික)—වැටුප් පරිමාණය.—රු. 600—6 × 40—රු. 840.

සුදුසුකම්.—(1) සැලසුම්කරුවන්ගේ ආධුනිකත්ව සහතිකය හෝ ඊට සමාන සහතිකයක් සහිතව, සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු හතක පළපුරුද්දක් තිබිය යුතුය. නැතහොත්

(2) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමර්ථ වීමෙන් පසුව සැලසුම් කරුවෙකු වශයෙන් දස අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුයි.

4. අභ්‍යන්තර විගණන ලිපිකරු.—(තනතුරු දෙකකි. ඉන් එකක් තාවකාලිකය).

වැටුප් පරිමාණය.—(1) රු. 265—7×15—රු. 480. (අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් ඇති අය සඳහාය.)

(2) රු. 375—7 × 15—රු. 480. (අවම වශයෙන් අවුරුදු හයක පළපුරුද්දක් ඇති අය සඳහාය.)

සුදුසුකම්.—පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය හෝ අ.පො.ස. සා/පෙ විභාගය අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී ගණිතය, අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතයද ඇතුළත්ව සමත් වී තිබීම සහිතව, වරලත් ගණකාධිකාරීන්ගේ සමාගමයෙක හෝ වෙනත් පිළිගත් ආයතනයක විගණක කටයුතු පිළිබඳව අවුරුදු 3/6 ක පළපුරුද්දක් ලබා සිටීම.

2. සේවා කොන්දේසි හා බඳවා ගැනීමේ කොන්දේසි :—

(අ) එක් අභ්‍යන්තර විගණක ලිපිකරු තනතුරක් හා පොත් තබන්නාගේ තනතුරද හැර සෙසු තනතුරු ස්ථිරය.

(ආ) සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් වැටුපෙන් 6% ක් ගෙවිය යුතුය. සංයුක්ත මණ්ඩලයේ දායක මුදල 9% කි.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය.

(ඈ) උසස් සුදුසුකම් හා වැඩි පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ඉහත සඳහන් කරනලද අදාල වැටුප් පරිමාණයන්හි සුදුසු පියවරවල් මත පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

(ඉ) තාවකාලික තනතුරක් සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවෙකුට මෙම සංයුක්ත මණ්ඩලයේ ස්ථාවර තනතුරක් සඳහා කිසිදු හිමිකමක් නොමැතියි.

3. රාජ්‍ය සේවාවෙහි නියුක්ත වූවන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද සංයුක්ත මණ්ඩල සේවාවෙහි නියුක්ත වූවන් එබඳු මණ්ඩලයන්හි සභාපතිවරුන් මගින් ද ඉදිරිපත් කළ යුතුය.

4. සුදුසුකම් හා පළපුරුද්ද ආදිය සවිස්තරව ඇතුළත් කළ අයදුම් පත්, 1973 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ, තැ. පෙ. 1212, ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

අයදුම් පත්‍රය බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

එස්. ඉගලගේවා,
ලේකම්/පිරිස් කළමනාකාර.

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,
167, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.
1973 නොවැම්බර් මස 27 දින.

12-123—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ මහා විද්‍යාලයන්හි II වැනි ශ්‍රේණියේ විශේෂ තනතුරු

යථෝක්ත තනතුරු සඳහා අයදුම්පත් කැඳවමින් 1973.09.21 දින අංක 78 දරණ ශ්‍රී ලංකා ජනරජ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නිවේදනය කෙරෙහි අවධානය මෙයින් යොමු කරවනු ලැබේ. පුහුණුවෙන් පසු අවුරුදු පහක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති සියළුම පුහුණු ගුරුවරුන්ට මෙම තනතුරු සඳහා අයදුම් කිරීමට ඉඩකඩ සැලසෙන පරිදි මෙම ගැසට් නිවේදනයේ 4 (ඇ) වැනි ඡේදයේ දැනට ඇති iv හා v දරණ උප ඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත සඳහන් අළුත් උප ඡේදය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

> " (iv) පුහුණුවෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පුහුණු ගුරුවරයකු හෝ "

මේ අනුව ගැසට් නිවේදනයේ 4 (ඇ) ඡේදයේ (vi) හා (vii) දරන උප ඡේද පිළිවෙළින් (v) හා (vi) වැනි උප ඡේද වශයෙන් සංශෝධනය විය යුතුය.

2. මෙම සංශෝධනය නිසා අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1973 දෙසැම්බර් මස 29 දක්වා දීර්ඝ කරනු ලැබේ.

3. 1973.09.21 දින අංක 78 දරණ ගැසට් නිවේදනය අනුව දැනටමත් අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවිය යුතු නොවේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 නොවැම්බර් මස 28 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

12-128—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### වැගම්පත්තු කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධූරය

මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රා. උ. දි. කොට්ඨාශයේ වැගම්පත්තු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත් තමාගේ අත් අකුරෙන් සම්පූර්ණ කොට, 73.12.31 දිනට හෝ ඊට පෙර ලේඛනගත තැපෑලෙන් මොණරාගල දිසාපති, කච්චේරිය, මොණරාගල යන ලිපිනයට එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුප් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50ක දීමනාවක් පමණක් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම් :—**

(අ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු 60 කට නොවැඩි විය යුතුය.

(ආ) ඉල්ලුම්කරු වැගම්පත්තු කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඇ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි හත්වන ප්‍රමාණයෙන් සමත් විය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර යෝග්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ හා සංස්ථාවල සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා නුසුදුස්සන් බැවින් ඔවුන්ගේ අයදුම්පත් භාරගනු නොලැබේ.

6. අයම්දුපත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

නිමල් සමරසුන්දර,
සහකාර දිසාපති,
මොණරාගල දිසාපති වෙනුවට.

1973 නොවැම්බර් මස 21 දින,
මොණරාගල දිසාපති කාර්යාලයේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

### වැගම්පත්තු කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිළි අකුරෙන්) ලිපිනය :————.

2. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

3. 1973.12.31 දිනට වයස : අවු. :————.
උපන් දිනය :————. උපන් ස්ථානය :————.

4. අධ්‍යාපනික සුදුසුකම් :————.

5. දැනට කරන රක්ෂාව :————.

6. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

7. තමන් සතු දේපලවල වටිනාකම මත එහි ප්‍රමාණය (විස්තර සහිතව) :————.

8. ඉල්ලුම්කරු ණය ගැතිද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයෙන් දඬුවම් ලබා තිබේද :————.

10. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත්, ඒ පිළිබඳ විස්තර :————.

ඉහත දක්වන ලද කරුණු සම්පූර්ණ සත්‍ය බව සහතික කරමි. පත්වීම ලැබුණහොත් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම එය අවලංගු වීමට හේතුවක් බවත් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12-109—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### අල්-ආලිම් සහතික පත්‍ර විභාගය—1974

1. පූර්වෝක්ත විභාගය 1974 ජනවාරි මස 27 වැනි දින සිට පවත්වනු ලැබේ.

2. අනුමත කරන ලද සියළුම මද්රසාවලට ඇතුළත්වීමේ ලැයිස්තු තැපැල් කර යවා ඇත.

3. තැපෑලෙන් හෝ පැමිණ ඉල්ලුම්පත් ලබා ගන්නා අයදුම්කරුවන්ට ඒවා, 1973 දෙසැම්බර් මස 10 වැනි දින සිට 19 වැනි දින දක්වා කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

4. බාහිර හා මද්රසා අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1973 දෙසැම්බර් 20 වැනිදා වේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ දීය.

12-82—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය—1974 අප්‍රේල්

1. **විභාගය ආරම්භ කරන දිනය :** මෙම විභාගය 1974 අප්‍රේල් මස 15 වැනි දින ආරම්භ වේ.

2. **පාසැල් අයදුම්පත් : 1973** අප්‍රේල් විභාගයට අයදුම්කරුවන් ඉදිරිපත් කළ සියළුම පාසැල්වලට තැපැල් කර යවා ඇත. අයදුම්පත් ලැබී නැති පාසල් ප්‍රධානීන් තම පාසැලින් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන අයදුම් කරුවන්ගේ ගණන දන්වා අයදුම්පත් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ යුතුය. ප්‍රථම වතාවට අයදුම්පත් ඉදිරිපත් කරන පාසැල් ප්‍රධානීන් තම විදුහලේ අ. පො. ස. (උසස් පෙළ) පන්තිය අනුමත කරමින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ විසින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ද සහිතව, ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම් කරුවන් ගණන දැක්වෙන ලිපියකින් අයදුම්පත් ඉල්ලා එවිය යුතුය.

3. **බාහිර අයදුම්පත් :** අයදුම්පත් තැපැලෙන් ලබාගැනීමට කැමති අයදුම් කරුවන් තමන්ගේ ලිපිනය ද, වම්පස උඩ කෙළවරේ "එස්. ජී/5" යනුවෙන් ද ලියූ මුද්දර නොමැති දිග කවරයක් එවිය යුතුය. (ලියුම් කවරයේ ඉහත දැක්වෙන අංකය සඳහන් කිරීමට විශේෂයෙන් මතක තබාගත යුතුය.) මෙම අයදුම් පත් තැපැලෙන් ලබාගත හැක්කේ 1973 දෙසැම්බර් මස 20 වැනි දින තෙක් **පමණි.** 1974.01.07 වැනි දින සිට 1974.01.13 වැනි දින දක්වා අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ විමසීම් කාර්යාලයට පැමිණ ලබාගත හැකිය.

4. මේ විභාගය සඳහා කවර හේතුවක් නිසා වුවද යල් පැනපු අයදුම්පත් පාවිච්චි නොකළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම් පත් කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. සියළුම විෂයයන් සඳහා (කලා සහ විද්‍යා) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 1974 ජනවාරි 15 වේ.

බෝගොඩ ප්‍රේමරත්න,
**විභාග කොමසාරිස්.**

1973 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාතර්මේන්තුවේදි ය.

**12–80—73.12.07** දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය—කොළඹ 10

**පාඨමාලාවන්ට ඇතුළත්වීම—1974 අධ්‍යයන වර්ෂය**

පහත සඳහන් නව අධ්‍යයන පාඨමාලාවන්ට ඇතුලත් කර ගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

1. සංචාරක කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව—

| | |
|---|---|
| කාලසීමාව : | අවුරුදු 2යි ; පූර්ණ කාලීන දිවා |
| මාධ්‍යය : | ඉංග්‍රීසි |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | අ.පො.ස. (උසස්පෙළ) විභාගයෙන් අඩු ගණනේ විෂයයන් 2කින් සමත්වීම සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම. |

2. භෝජනාගාර පාලනය සහ භෝජන සැපයුම පිළිබඳ ඩිප්ලෝමාව—

| | |
|---|---|
| කාල සීමාව : | අවුරුදු 2යි ; පූර්ණ කාලීන දිවා. |
| මාධ්‍යය : | ඉංග්‍රීසි |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අඩු ගණනේ විෂයයන් 2කින් සමත්වීම සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම. |

3. විදේශීය භාෂාවන් පිළිබඳ ඩිප්ලෝමාව—

| | |
|---|---|
| කාල සීමාව : | අවුරුදු 2යි ; පූර්ණ කාලීන දිවා |
| මාධ්‍යය : | ඉංග්‍රීසි |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයයන් 3කින් සමත්වීම සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් තිබීම. |

4. සංගීත භාණ්ඩ සෑදීමේ පාඨමාලාව—

| | |
|---|---|
| කාල සීමාව : | මාස 3යි (එක වාරයයි) අර්ධකාලීන දිවා |
| මාධ්‍යය : | සිංහල |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | ලී වැඩ විෂයයට සාමාර්ථයක් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විෂයයන් 6 කින් සමත්වී සිටීම හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් සුදුසුකම් ලබා තිබීම. |

5. කොන්ක්‍රීට් ඉදිකිරීම සඳහා වූ හැඩයම් හා හැඩයම් පෙට්ටි (ෂටරින්) සෑදීම—

| | |
|---|---|
| කාල සීමාව : | වාර 2යි. (සන්ධ්‍යා කාල) |
| මාධ්‍යය : | සිංහල |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවීම. |
| අධ්‍යාපන සුදුසුකම් : | 8 වෙනි ශ්‍රේණිය ; අයදුම්කරුවන් ගොඩනැගිලි වෘත්තියෙහි (ලී වැඩ) යෙදී සිටින්නන් විය යුතුය. |

6. වාත්තු මල් සෑදීමේ පාඨමාලා—

| | |
|---|---|
| කාල සීමාව : | එක් අවුරුදු ; සන්ධ්‍යා |
| මාධ්‍යය : | සිංහල |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | 8 වෙනි ශ්‍රේණිය ; අයදුම්කරුවන් ලී වැඩ වෘත්තියෙහි යෙදී සිටින්නන් විය යුතුය. |

7. වාත්තු වැඩ පිළිබඳ පාඨමාලාව—

| | |
|---|---|
| කාල සීමාව : | එක් අවුරුදු ; සන්ධ්‍යා |
| මාධ්‍යය : | සිංහල |
| වයස : | 1974.1.1 දිනට අවුරුදු 17ට වැඩිවිය යුතුය. |
| අධ්‍යාපන සුදුසුකම් : | 8 වෙනි ශ්‍රේණිය ; අයදුමකරුවන් සම්බන්ධිත වෘත්තියේ යෙදී සිටිය යුතුය. |

පහත දී ඇති ආකෘති ඉල්ලුම් පත්‍රයට අනුව, නිසියාකාර ලෙස සකස් කළ අයදුම් පත් 1973.12.31 දිනට පෙර, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ, ලේකඛාධිකාරී තැනට ලැබෙන සේ ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

අවුරුදු 1 හා 1 ට අඩු පාඨමාලා සඳහා අයදුම් පත් ගාස්තුව රුපියලකි. අවුරුදු 1ට වැඩි පාඨමාලා සඳහා අයදුම් පත්‍ර ගාස්තුව රුපියල් 2 කි. අයදුම් පත්‍රයෙහි, මෙම නියමිත ගාස්තුවලට සමාන මුද්දර අලවා, ඒ මත අයදුම් කරුගේ අත්සන තබා අවලංගු කළ යුතුය. එක් එක් පාඨමාලාව සඳහා වෙන වෙනම අයදුම් පත්‍ර එවිය යුතුය.

නියමිත වටිනාකම අඩු මුද්දර අලවා ඇති හෝ අසම්පූර්ණ වූ හෝ නියමිත දිනයට පසුව ලැබෙන හෝ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

අර්ධ කාලීන හා සන්ධ්‍යා කාලීන පාඨමාලා සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කෙරේ :—

1. වෘත්තිය පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා—මසකට රු. 15 බැගින්
2. ශිල්පීය වට්ටමේ පාඨමාලා—මසකට රු. 10 බැගින්
3. පුහුණු මට්ටමේ පාඨමාලා—මසකට රු. 5 බැගින්

ටී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපන)
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අධ්‍යාපන අමාත්‍යාංශය.
මැලේ වීදිය, කොළඹ 2.
1973.11.28 දින දීය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය—12" × 8"

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය

**අධ්‍යයන වර්ෂය—1974**

**සැ.යු.**—මෙම අයදුම් පත සම්පූර්ණ කොට කොළඹ 10, ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත කෙලින්ම එවිය යුතුය.

1. පාඨමාලාව :———— දිවා/සන්ධ්‍යා :————
2 අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
3. මුලකුරු සමඟ නාම :————.

4. (අ) උපන් දිනය :————.

(ආ) 1974.1.1 ට වයස : අවුරුදු——, මාස——, දින——.

5. ජාතිය :————.

6. ස්ත්‍රී/පුරුෂ බව :————.

7. පුද්ගලික ලිපිනය :————.

8. රාජකාරි ලිපිනය :————.

9. සාමාර්ථ්‍ය ලත් විභාග (වර්ෂය සහ මාසය සඳහන් කරන්න. විෂයයන් සහ ප්‍රවීනතා සහිතව) :————.

10. අයදුමකරුගේ රක්ෂාව කුමක්ද, එය කවරකු යටතේද යන වග සමඟ ඔහුගේ ලිපිනය, රැකියාවේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තරද සැපයිය යුතුයි :————.

11. පියාගේ/භාරකාරයාගේ නම, ලිපිනය සහ රක්ෂාව :————.

12. මෙහි ඉහත සඳහන් කරුණු සැබෑ බවට සහතික කරමි.

මුද්දර

————,
ඉල්ලුමකරුගේ අත්සන.

දිනය :————.

12–132—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය—කළුතර කණිෂ්ඨ කාර්මික ආයතනය

1974 අධ්‍යාපන වර්ෂය සඳහා කළුතර කණිෂ්ඨ කාර්මික ආයතනයට සිසුන් ඇතුලත් කර ගැනීම

පහත සඳහන් පාඨමාලාවන් සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් භාර ගනු ලැබේ. මෙහි ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973.12.31 වැනි දින හෝ ඊට පෙර කළුතර කණිෂ්ඨ කාර්මික ආයතනයේ විදුහල්පති වෙත ලැබෙනසේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

| I. ජාතික වෘත්තිය සහතික පාඨමාලා | පාඨමාලාවේ ස්වභාවය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|---|
| (අ) යන්ත්‍රණය | ... පූර්ණ දිවාකාල දෑවුරුදු (සිංහල මාධ්‍යය) | ... 8 වැනි ශ්‍රේණිය හෝ 8 වැනි ප්‍රමාණය. වයස 1974.01.01 දිනට අවුරුදු 18ට නොවැඩිවිය යුතුය. |
| (ආ) ස්වයංක්‍රිය යාන්ත්‍රික විද්‍යාව | | |
| (ඇ) වඩුවැඩ සහ වැද්දුම් වැඩ | | |
| (ඈ) ගොඩනැගිලි වෘත්තිය | | |
| (ඉ) ගොඩනැගිලිවල විදුලි උපකරණ සවිකිරීම | | |
| II. ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික සහතිකය | ... පූර්ණ දිවා කාල දෑවුරුදු (සිංහල මාධ්‍යය) | ... ගණිතය හෝ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ සිංහල භාෂාව ඇතුලුව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් (අ.පො.ස ) (සා.පෙ ) විභාගය සාමාර්ථය. වයස 1974 01.01 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. |

මෙම පාඨමාලාව පහත දක්වෙන විෂය ක්ෂේත්‍ර යටතේ පැවැත්වේ.

(අ) ගණකාධිකරණය,

(ආ) අලෙවිකරණය,

(ඇ) පරිපාලන පරිචය,

(ඈ) යතුරුලියනය හා ලඝුලේඛණය.

(3) බඳවා ගැනීම.—අයදුමකරුවන් බඳවා ගනු ලබන්නේ ප්‍රවේශ විභාගයකින් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුවය.

(4) නියමිත ආකෘති පත්‍රවල නිසි ලෙස පුරවා නොමැති හෝ ප්‍රමාදව් ලැබුණු සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ටී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපනය),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2,
1973 නොවැම්බර් 27 දින.

ආදර්ශ අයදුම් පත්‍රය

කළුතර කණිෂ්ඨ කාර්මික ආයතනයේ සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලා සඳහා ඇතුල්වීමේ අයදුම් පත—1974 අධ්‍යාපන වර්ෂය

1. පාඨමාලාවේ නම :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

3. මුලකුරු සමග නම :————.

4. උපන් දිනය :— 1974.01.01 දිනට අවුරුදු :————. මාස :————. දින :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඉල්ලුම්පත සමග එවිය යුතුය)

5. ස්ත්‍රී පුරුෂ භාවය :————.

6. පුද්ගලික ලිපිනය :————.

7. සාමාර්ථය ලත් විභාග (වර්ෂය සහ මාසය සඳහන් කරන්න) :————.
(විෂය සහ ප්‍රවීණතා සහිතව)

8. පියාගේ/භාරකරුගේ නම, ලිපිනය සහ රැකියාව :————.

9. මෙහි ඉහත සඳහන් කරුණු සැබෑ බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–131—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු උපදේශකවරුන් පිළිබඳ සහතික පත්‍ර විභාගය—1973

1974 ජනවාරි මස 26 සහ 27 යන දිනවල පැවැත්වෙන මෙම පරීක්ෂණය සඳහා අයදුම් පත් 1973 දෙසැම්බර් මස 22 වැනි ද දක්වා භාරගනු ලැබේ.

### ව්‍යවස්ථා

**හැඳින්වීම.**—මෙම පරීක්ෂණය පිළිබඳ ව්‍යවස්ථා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සකස් කරන ලදී. විභාග කොමසාරිස් විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් මෙම පරීක්ෂණය පවත්වනු ලැබේ.

2. **විභාග මධ්‍යස්ථාන.**—(i) අනුරාධපුරය, බණ්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, ගාල්ල, කළුතර, යාපනය, මහනුවර, කුරුණෑගල, මාතර සහ රත්නපුරය.

(ii) තමන්ට අභිමත මධ්‍යස්ථාන දෙකක් අයදුම්කරුවන් විසින් තෝරාගත යුතුය. අයදුම්කරුවන් යැහෙන ගණනක් ඇතුළු නොවන කවර මධ්‍යස්ථාන යක් වුවත් අවලංගු කරනු ලැබේ.

(iii) අයදුම්කරු විසින් තෝරාගෙන තිබෙන මධ්‍යස්ථානයක් සාමාන්‍යයෙන් වෙනස් කරනු නොලැබේ. එහෙත් ගුරුවරයකු දුර බැහැර ස්ථානයකට මාරු කරනු ලැබීම වැනි විශේෂ අමාරුකම් ඇතිවූ විට කල් ඇතිව දැනුම් දීමක් ලද හොත් ඒ ගැන සලකා බලනු ලැබේ.

3. **විභාග පවත්වන භාෂා මාධ්‍යය.**—මෙම විභාගය සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන් පමණක් පවත්වනු ලැබේ.

4. **විභාගයට පෙනී සිටීමට සුදුසුකම්.**—(i) පිළිගත් පාඨශාලාවල හෝ පිළිගත් අභ්‍යාස විද්‍යාලවල ඉගැන්වීමෙහි යෙදී සිටින්නාවූද, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද මාර්ගෝපදේශකත්වයෙහි සම්පූර්ණ පුහුණුවක් සේවයෙහි යෙදී සිටින අතර ලැබුවාවූද පුහුණු පළමුවන පෙළ ගුරුවරුන්ගෙන්, උපාධිධාරීන්ගෙන් සහ පුහුණු උපාධිධාරීන්ගෙන් මෙම විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

5. **විභාගයට ඇතුළත් කිරීම.**—(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියලුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවකු එසේ ඇතුළත් කිරීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන්නේය. විභාගයට පෙර හෝ, එය පවත්වන අතර හෝ ඉන් පසු හෝ මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසුයයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අයදුම්කරුවකුට සහතික පත්‍රයක් නිකුත් කොට තිබේනම් එයද ආපසු ගෙන්වා අවලංගු කරනු ලැබේ.

6. **අයදුම් පත්‍ර.**—(i) මෙම විභාගය සඳහා අයදුම් පත් මේ දෙපාර්තමේන්තු වෙන් නිකුත් කරනු නොලැබේ. මෙහි අවසනට ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව අඟල් 8×13 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (ටයිප් කරගත හැකි නම් වඩා යෝග්‍යය) සකස් කරගත් ආකෘති පත්‍ර මේ සඳහා භාවිත කළ යුතුය.

(ii) අයදුම් පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිවද නිවැරදිවද සම්පූර්ණ කළ යුතුයි. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙසේ හෝ විභාගයට පෙනී සිටි එවැනි අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වයද අවලංගු කරනු ලැබේ.

(iii) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර, කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙනසේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත්‍ර බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළින් විභාගයේ නමද තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානයද සටහන් කළ යුතුය.

(iv) අයදුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

(v) කිසිම ලියවිල්ලක් අයදුම් පත්‍රය සමග නොඑවිය යුතුයි.

7. **විභාග ගාස්තු.**—සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයට රු. 25ක් වටිනා මුද්දර අලවා එහි තම අත්සන හා දිනය යෙදීමෙන් අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකළ මුද්දර එවීම සම්බන්ධයෙන් මෙම කාර්යාලය වග කියනු නොලැබේ.

8. **ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කිරීම.**—(i) පහත දක්වන පරිදි එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

(අ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත, හෝ අන්කිසි විධියකින් ව්‍යවස්ථානුකූල නොවන ඉල්ලුම් පත්‍ර.

**(ආ) නියමිත මුද්දර ගාස්තු නැති ඉල්ලුම් පත්‍ර.**

(ඉ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර.

**(ii) යම් හෙයකින් ඉහත (අ), (ආ) හෝ (ඉ) හි සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් එවන ලද අයදුම්කරුවකු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ/ඇගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.**

(iii) අයදුම් පත් ප්‍රතික්ෂේප කළ විට මුද්දර ගාස්තුව රජය සන්තක වෙනවා ඇත.

9. **මුදල් ආපසු ගෙවීම.**—වරක් ගෙවන ලද විභාග ගාස්තු සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. එතෙකුදු වුවත් අයදුම්කරුවකුගේ මරණය නිසා හෝ බරපතල කල්ගිය රෝගයකින් (උද.—ක්ෂය රෝගය, අංශබාගය, මානසික හෝ නගරයක ආබාධයකින්) පෙළෙමින් සිටීම නිසා හෝ විභාග ගාස්තු සම්පූර්ණයෙන් ආපසු ගෙවනු ලැබේ. මෙසේ ගෙවනු ලබන්නේ විභාගයෙහි එක් ප්‍රශ්න පත්‍රයකටවත් අයදුම්කරු පෙනී නොසිටියහොත් පමණි. මේ සඳහා, අයදුම්කරුවකුගේ මරණයක් නම් මරණ සහතිකයද, ඉහත සඳහන් අසනීපයක් නම් ඒ පිළිබඳ විභාග කොමසාරිස්ට පිළිගත හැකි වෛද්‍ය සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුයි.

මුදල් ආපසු ලබාගැනීම සඳහා කරන ඉල්ලීම් විභාගයේ අවසාන දින සිට දින 14ක් ඇතුළත ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. එහි නම, ලිපිනය, විභාග අංකය, ඉල්ලූ මධ්‍යස්ථානය ආදිය සඳහන් කළ යුතුයි. මුදල් ආපසු ඉල්ලා නියමිත දිනයෙන් පසුව එවන ලිපි, ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. **ප්‍රවේශ පත්‍ර.**—විභාගය පැවැත්වීමට දින 7කට පමණ පෙර යම් හෙයකින් අයදුම්කරුවකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය "විභාග—කොළඹ" ඒ බව නොපමාව දන්වා එවිය යුතුයි) විදුලි පුවතකින් මෙසේ දන්වීම වඩා හොඳය. හැකි නම් පැමිණ විමසන්න. පහත සඳහන් විස්තර අවශ්‍යයෙන්ම සැපයිය යුතුය :—

(i) විභාගයේ නම,

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම,

(iii) සම්පූර්ණ ලිපිනය,

(iv) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය,

(v) ඉල්ලුම් පත්‍රය එවූ දිනය, එය ලියාපදිංචි කළ තැපැල්පළ හා ලියාපදිංචි අංකය.

11. **හැඳින්වීමේ පත්‍ර.**—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයයට පෙනී සිටින විට විභාගශාලාධිපතීන්ට පිළිගත හැකි වන පරිදි තමන් පිළිබඳ හැඳින්වීමක් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් ඕනෑම එකක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල්තැන විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක්,

(ආ) විභාග දිනයට කලින් තුන් අවුරුද්දක් ඇතුළත නිකුත් කරන ලද්දවූද, වලංගුව පවතින්නාවූද, " පාස්පෝට් " බලපත්‍රයක්,

(ඉ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දවූද, තම ඡායාරූපය දරන්නාවූද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

(ඊ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රයක්.

(ii) ඉහත සඳහන් ලියවිලිවලින් **එකක් හෝ යම් විධියකින් ලබාගෙන නැතිනම් ඒ වෙනුවට අපේක්ෂකයාගේ ඡායාරූපයක පිටපතක් බාරගනු ලැබේ. ඡායාරූපයක් එසේ බාරගනු ලබන්නේ ඔහුගේ සම්පූර්ණ නම, ලිපිනය හා පුරුදු අත්සනද ඒ ඡායාරූපය එය අත්සන් කළ තැනැත්තාගේ ඡායාරූපය බවට ඔහුගේ ප්‍රධානාචාර්යවරයාගේ අත්සන් සහිත සහතිකයක්ද එහි අනික් පිටෙහි තිබුණොත් පමණකි.**

අයදුම්කරු පාසලක ප්‍රධානියෙක් නම් ඔහුගේ ඡායාරූපය පිට පැත්තෙහි වෙනත් පාසලක මුල් ගුරුවරයෙකුගෙන් ඉහත දක්වන ලද පරිදි සහතිකයක් ලබාගත යුතුයි.

12. **විභාග පරිපාටිය.**—(i) 1972 සහ ඉන්පසු ගුරු උපදේශක සහතික පත්‍ර විභාගය පහත දක්වෙන පරිදි විෂයයන් පහකින් යුක්ත වේ :—

| | | | | |
|---|---|---|---|---|
| | | | | ලකුණු |
| (1) අධ්‍යාපන මනෝ විද්‍යාව ... ... ... ... | පැය 3 යි ... | | | 100 |
| (2) ඇගැයීම හා සංඛ්‍යාලේඛන ... ... ... ... | පැය 3 යි ... | | | 100 |
| (3) ළමයින් හා රැකියා අධ්‍යාපනය ... ... ... ... | පැය 3 යි ... | | | 100 |
| (4) මාර්ගෝපදේශ මූලධර්ම හා න්‍යාය ... ... ... ... | පැය 3 යි ... | | | 100 |
| (5) I කොටස—මාර්ගෝපදේශ ව්‍යවහාරය— | | | | |
| (දෙන ලද අවස්ථාවනට මාර්ගෝපදේශ මූලධර්ම අදාල කෙරෙන ආකාරය අළලා සකස් කළ සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයක්) ... ... ... ... | පැය 1½ යි ... | ලකුණු 60 | | |
| II කොටස—ප්‍රායෝගික වැඩ ... ... ... ... | ... | 40 | | |
| | | | | 100 |
| | | මුළු ලකුණු ... | | 500 |

(ii) මෙම විභාගයෙන් සමත්වීම සඳහා විෂයයන් පහෙන්ම එක්වරම සමත් විය යුතුය.

**සැ.යු.**—කලින් පරණ නිර්දේශයට අනුව විභාගයට පෙනී සිට අසමත්වූ අයදුම්කරුවන් සඳහා පරණ නිර්දේශය අනුවද සෑහෙන තරම් ප්‍රශ්න ඇතුළත් පොදු ප්‍රශ්න පත්‍ර පිළියෙල කෙරෙන අතර ඔවුන් පස්වන විෂයයෙන් නිදහස් කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ මෙවර පැවැත්වෙන විභාගයේදී පමණි. 1974 වර්ෂය අවසන පැවැත්වෙන විභාගයේ සිට ඉහත 12(i) හි දක්වෙන පරිදි පමණක් විභාගය පැවැත් වේ.

13. **ප්‍රතිඵල.**—එක් එක් විෂයයෙන් සමත් හෝ අසමත් බව දක්වෙන ප්‍රතිඵල සටහනක් විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත තැපැල් කර එවනු ලැබේ.

14. **සහතික පත්‍ර.**—විභාගයෙන් සමර්ථ වන අයදුම්කරුවෝ පාඨශාලාවල ගුරු උපදේශකයන් වශයෙන් ක්‍රියා කිරීමට යෝග්‍ය බව දක්වෙන සහතික පත්‍ර ලැබීමට සුදුස්සෝ වෙති. එහෙත් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ සමර්ථවූ අයදුම්කරු විසින් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්තැනගේ නියමයන් සම්පූර්ණ කිරීමෙන් පසුවය.

15. **විෂයය නිර්දේශ.**—අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංවිධානය කළ මධ්‍යස්ථානවල පුහුණුව ලබන්නන්ට විෂය නිර්දේශ තමන්ගේ කථිකාචාර්යවරයාගෙන් ලබාගත හැක.

16. **ව්‍යවස්ථාවන් වෙනස් කිරීම.**—විභාගය පිළිබඳ ව්‍යවස්ථා විශාලව වෙනස් කළ විට ඒ බව පුවත්පත් මඟින් දනුම් දෙනු ලැබේ.

17. **වෙනත් කරුණු.**—මෙම ව්‍යවස්ථාවන්හි සඳහන් නොවූ යම්කිසි කරුණක් පිළිබඳ නිරණය විභාග කොමසාරිස් විසින් (අවශ්‍ය නම් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගේද අනුමැතිය ඇතිව) කරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේ දිය.

ආදර්ශ අයදුම් පත

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ගුරු උපදේශකවරුන් පිළිබඳ සහතික පත්‍ර විභාගය

ඇතුළත්වීමේ අයදුම් පත්‍රය

.................................. (වර්ෂය)

ස්ත්‍රී පුරුෂ භාවය : ....................

| | | | |
|---|---|---|---|
| 1. අයදුම්කරුගේ නම | (අ) අයදුම්කරුගේ පුරුදු අත්සන | | (කාර්යාලයේ ප්‍රයෝජනය පිණිසයි) |
| | (ආ) සාමාන්‍ය නම (මුලකුරු සමග) | | |
| | (ඉ) සියලු නම් සම්පූර්ණයෙන් | | විභාග අංකය |

| | |
|---|---|
| 2. දැනට ඉගැන්වීම කරන පාසැල/විද්‍යාලය | |
| 3. පෞද්ගලික ලිපිනය | |
| 4. විභාගයට ඉදිරිපත් වන මාධ්‍යය | |
| 5. විභාගය ඉල්ලුම් කරන මධ්‍යස්ථානය | (i) ............................................(ii) ............................................ |

6. සහතික පත්‍රයේ විස්තර

උපාධිය : ............................................ විශ්ව විද්‍යාලය : .............................. වර්ෂය : ....................................

පශ්චාත් උපාධි පුහුණුව

ආයතනය :............................................................................................................ වර්ෂය : ..............................

| | | |
|---|---|---|
| පුහුණු ගුරු සහතිකය | මාධ්‍යය : ..............................................<br>ආයතනය : ..............................................<br>සහතික පත්‍රයේ අංකය : ..............................................<br>සහතික පත්‍රය නිකුත් කළ දිනය : ..............................................<br>සහතික පත්‍රය පළමුවැනි පෙළට උසස් කළ දින : .............................................. | 7. දැනට ඉගැන්වීම කරන පාසැලේ සේවා කාලය<br><br>..............................පටන් ........................දක්වා |

8. සේවයෙහි යෙදී සිටින කාලය අතර ලැබූ වෘත්තීය මාර්ගෝපදේශකත්වයෙහි පුහුණුව

ස්ථානය :.......................................................... කාලය :.......................... පටන් .......................................දක්වා

කථිකාචාර්යවරයාගේ නම :................................................................................................................

9. විභාග ගාස්තු

| |
|---|
| **මුද්දර අලවන කොටුව** |
| **විභාග ගාස්තුව.**—(මෙහි රු. 25ක් වටිනාකම ඇති ආදායම් මුද්දර අලවා අයදුම්කරුගේ අත්සන සහ දිනය යෙදීමෙන් අවලංගු කළ යුතුයි. අත්සන කොටසක් මුද්දරවලද කොටසක් කඩදාසියේද සිටින ලෙස යෙදිය යුතුයි.) |

මා විසින් මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ හොඳ මුද්දර බව සහතික කරමි. විභාග කොමසාරිස් තැන විසින් අයදුම්කරුවන් සඳහා සකස් කරන නියෝගයන්ට බැඳී සිටීමට මම එකඟ වෙමි.

අයදුම්කරුගේ අත්සන :..............................

දිනය :..............................

අයදුම්කරු උගන්වන විද්‍යාලයේ ප්‍රධානතැනගේ සහතිකය—

...........................................................................................මහත්මයා/මහත්මිය මගේ පාඨශාලාවේ අනුමත කරන ලද ආචාර්ය මණ්ඩලයෙහි නියුක්ත බවත්, මෙහි 6 සහ 7 වන කොටුවල දී තිබෙන විස්තර සොයා බැලූ බවත් ඒවා සත්‍ය බවත් සහතික කරමි. අද දින මා ඉදිරිපිට තබන ලද ඔහුගේ අත්සනද සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :..............................................

පාඨශාලා ප්‍රධානතැනගේ අත්සන :..............................................

දිනය :..............................................

විද්‍යාලය :..........................................................................................................

ලිපිනය :..........................................................................................................

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැල කර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන්වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහායකයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය බාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවනතුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුයි. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලාවේ කාර්‍ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කරගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයට, පිළිතුරු දෙකැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, ෆයිල් කවර, කාර්ඩ්බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසි විටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තක ව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම් කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් නෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග, ශාලාවේ දී ඉදිරිපත් නො කළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙද දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතිට දන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජන යට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලි ව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු ක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදි ව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ, පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍ර විභාගාශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාරදිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතුවිය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

12-148—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය — වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් . | 0 60 | 0 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම සඳහා, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් ... | 07.12.73 | සිකුරාද ... | 28.11.73 | බදාද | දහවල් | 12.00 |
| | 14.12.73 | සිකුරාද ... | 05.12.73 | බදාද | දහවල් | 12.00 |
| | 21.12.73 | සිකුරාද ... | 12.12.73 | බදාද | දහවල් | 12.00 |
| | 28.12.73 | සිකුරාද ... | 19.12.73 | බදාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.